# ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝක ඉතිහාසයේ කරුණුද ඇතුළත්

# මහාවංසය ආරක්ෂා කළාට පේරාදෙණි සරසවියට තුති

## යුනෙස්කෝ අධ්‍යක්ෂ ඕඩ්‍රි අසූලේ කියයි

6 පිටුවට



පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඇති මහාවංසය පුස්කොළ පොත ලෝක උරුමයක් බවට නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඊට අදාළ ලෝක උරුම සහතිකය පිරිනැමීම යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ඕඩ්‍රි අසූලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඊයේ (17) සිදු කෙරිණි. එහිදී අධ්‍යක්ෂ ජනරාල්වරිය පුස්තකාලයට පැමිණ ඉපැරණි මහාවංසය පුස්කොළ පොත සිය නිරීක්ෂණයට ලක් කළ අයුරු.

*ඡායාරූපය - රුවන් මීගම්මන*

# මහාවංසය ආරක්ෂා කළාට...

මහාවංසය ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝක ඉතිහාසය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් අඩංගු පුස්කොළ එකතුවක් බවත් එය මෙතෙක් කල් ආරක්ෂා කර ගැනීම සම්බන්ධව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට කෘතඥතාව පළ කරන බවත් යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ඕඩ්‍රි අසූලේ (Audrey Azoulay) මහත්මිය පැවසුවාය.

යුනෙස්කෝව මඟින් ලෝක උරුමයන් ලෙස නම් කළ ස්ථාන 08ක් ශ්‍රී ලංකාවේ පවතින බවත් පසුගිය වසර 75ක කාලයේදී ශ්‍රී ලංකාව යුනෙස්කෝව සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගනිමින් කටයුතු කළ බවත් ඇය පැවසුවාය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඇති මහාවංසය පුස්කොළ පොත ලෝක උරුමයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඒ සඳහා වන ලෝක උරුම සහතිකය පිරිනැමීම නිමිත්තෙන් ඊයේ (17) විශ්වවිද්‍යාලයේ පැවැති උත්සයකට සහභාගි වෙමින් අධ්‍යක්ෂ ජනරාල්වරිය මේ බව ප්‍රකාශ කළාය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ අංශාධිපති මහාචාර්ය රෝහිත දසනායක මහතා අදහස් දක්වමින් යුනෙස්කෝව මඟින් ලෝක උරුමයක් ලෙස නම් කළ මහාවංසය පත්ඉරු 238කින් සමන්විත බවත් එහි කිසිදු වෙනසක් නැතිව අඛණ්ඩව අපේ ඉතිහාසය අන්තර්ගත වන බවත් කීවේය.

ක්‍රිස්තු පූර්ව 06 වැනි සියවසේ පටන් 1815 දක්වා අඛණ්ඩව ලියවී තිබෙන ලෝකයේ ඇති පොත මෙය බවත් මෙහි ඇත්තේ එක් ජාතියක හා ආගමක ඉතිහාසය බවට වරදවා වටහා නොගත යුතු බවත් ඒ මහතා කීය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය ජී.එච් පීරිස්, උප කුලපති මහාචාර්ය එම්.ඩී. ළමාවංශ, පුස්තකාලයාධිපති රසයියා මහේෂ්වරන් යන මහත්වරුන් ඇතුළු පිරිසක් ආචාර්ය මහාචාර්යවරු පිරිසක් ද යුනෙස්කෝවේ සහ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජිත පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

< Dailynews 20...

# UNESCO Chief praises SL for preserving *Mahavamsa* Ola leaf manuscripts



**UNESCO Director General Audrey Azoulay is shown the Ola leaf manuscripts of the *Mahavamsa*, at the University of Peradeniya, yesterday. At this ceremony, the *Mahavamsa* was officially recognized as a World Heritage document.**

***Picture by Ruwan Meegammana***

ASELA KURULUWANSA

UNESCO Director General Audrey Azoulay expressed gratitude to the University of Peradeniya for preserving the *Mahavamsa* Ola Leaf manuscripts, which not only hold significance for Sri Lanka, but also contain valuable information on world history. Azoulay highlighted this during a ceremony at the university yesterday (17), where the *Mahavamsa* was officially recognized as a World Heritage document and the World Heritage certificate was presented.

TO PAGE 02»

# UNESCO Chief... From **page 01**

Azoulay noted that Sri Lanka, home to eight UNESCO World Heritage sites, has maintained a strong relationship with UNESCO over the past 75 years. She also emphasized UNESCO's commitment to safeguarding historically significant cultural sources worldwide and praised those who helped identify the authentic historical text of the *Mahavamsa* from several versions found in Sri Lanka.

Speaking at the event, Professor Rohitha Dissanayake, Head of the Department of History at the University of Peradeniya, explained that the *Mahavamsa* consists of 238 ola leaves and chronicles Sri Lanka's unbroken history without any alterations. He clarified that the manuscript should not be understood as solely the history of one nation or religion, as it covers a broad spectrum of historical events from the 6th century BCE to 1815.

The event was attended by distinguished guests, including Peradeniya University Chancellor Professor G.H. Peiris, Vice Chancellor Professor M.D. Lamawansa, Chief Librarian Rasaiya Maheshwaran, various academics, and representatives from UNESCO and the National Library Services Board. Following the ceremony, Azoulay visited the Temple of the Sacred Tooth Relic where she paid homage and received blessings.